# පහන වෙද ගෙදර විශේෂාංගය

## පීනස - Sinusitis

මාධව නිදාන ග්‍රන්තිය ආයුර්වේද රෝග විශ්දාන විෂයෙහි මූලාශ්‍ර ග්‍රන්තිය වේ. මෙහිදී පීනස ප්‍රතිශ්‍යා යනුවෙන් අර්ථ දක්වා ඇත. සාමාන්‍ය ප්‍රතිශ්‍යාව හෙවත් හෙම්බිරිස්සාව සතියකට පමණ සීමා වේ. පරණ හෙම්බිරිස්සාව පීනස නම් වේ.

කාලීන වශයෙන් රෝග ගක්‍ෂන හා ව්‍යාප්තිය අනුව පීනස් රෝග අවස්ථා පහක් දේශීය චිකිත්සාවේ ප්‍රකාෂ කර තිබේ.

දිය පීනස ගල් පීනස ලේ පීනස
ගඳ පීනස ලය පීනස මේ අවස්ථා පහයි.

### දිය පීනස

කල් අල්ලා සිටින ප්‍රතිශ්‍ය ගතිය වේ. නාසය නිතරම වාගේ තෙතමනයෙන් යුතු වේ. සොටු දියර නිතරම වාගේ ස්‍රාවය වේ. මේ අසහන කාරී තත්වය හේතුවෙන් ශරීරය ක්‍ෂය කරයි. අග්නි මාන්දය නිසා ආහාර රුචිය මදවේ, බඩගිනි අඩුවේ, උදේට නැගිටීම අපහසු වේ, මහන්සිය නිතරම දැනේ, නින්දට වැඩි කැමැත්තක් දක්වයි, අලස ගතිය, ඇඟ, අත්පා හා තුනටිය වේදනාව ඇතිවේ. මේ තත්වය නිසා අධික ලෙස කිඹුහුම් යාම, නාසය හිරවීම (Vasal Congestion) හා නාසයේ මස් දළු ඇතිවීම (Vasal Poly)උගුරේ සෙම් ගෙඩි සහ හිසේ බර ගතිය සහ හිස රුදාව පැවතිය හැක.

### ගල් පීනස

ශ්වසන ව්‍යුහය (Respiratory System) ආශ්‍රහස්ථාන කොට ජනිත වන්නාවූ මහා අසහන කාරී රෝගාවසතාවකි. සෙම තදවී, හිරවී වියලි ගතිය නිසා වැලඳෙන මෙම රෝගය තදවූ හිස රදයත් නිසා මෙය ගල් පීනස ලෙස හැඳින්වේ.

### ලේ පීනස

රක්ත දොෂ සහිත පීනස් අවස්ථාවෙන් පසුව නාසයේ ඇතුලත ඇතිවන සියුම් තුවාලත්, විටින් විට ඇතිවන තද වීම නිසා තුවාල වලට පීඩන ඇති වී වේදනාව ගෙනදේ. කිවිසුම් යාමේදී මේ නිසා සොටු දියර සමග ලේ යාමද දැකිය හැකිය. මේ නිසා ලේ පීනස ලෙස හඳුන් වන මෙය විශ රක්ත දෝෂයට අදාල අනිකුත් රෝග ලක්‍ෂණ පවතී.

### ගඳ පීනස

කල් ගතවූ කැස්ස, පපුවේ හතිය මහන්සිය, ඇදුම වැනි රෝග ලක්‍ෂණ වලට අමතරව බොහෝ විට නාසයෙන් දුගඳ එමන බවක් නිරීක්‍ෂණය කල හැක. මේ බව රෝගියාට බොහෝ විට නොදැනේ. මේ නිසා සමාජයෙන් කොන් වීම මෙම රෝගීන් හට මානසිකව බල පායි.

මේ තත්වය හේතුවෙන් විෂ රක්ත දෝෂය සමග පීනස් රෝගය නිදන් ගත වූ විට දත් මුල් දිය වීම නිසා මුවින්ද දුර්ගන්දය පැතිරීමට පටන් ගත හැක.

### ලය පීනස

කල් ගත වූ කැස්ස, පපුවේ හතිය, ඇදුම වැනි රෝග ලක්‍ෂණ සහිතව දිගු කලක් රෝගීව සිටීම නිසා ලය පීනස ඇති වේ. පෙනහලු වලට බලපෑ ප්‍රගිත ශ්ලේෂ්මල නිසා පපුවේ "රෑං රෑං" ශබ්දය පැවතිය හැකිය.
මල බද්ධය පවතින විට හතිය හා ඇදුම ගතිය නිතර පවතී. කැස්ස සමග පිටවන සෙම නරක්වී තද කහ පැහැ වී දුගඳ හමන තත්වයේ පවතී.

මේ රෝගී තත්වයන්ට මූලික හේතුව දීර්ඝ කාලයක් තිස්සේ සීත ආහාර ගැනීම, සීත කාලයේ ඇඟ උණුසුම්ව තබා නොගැනීම, රෝගී තත්වයෙන් පසු පහසුව නිසා නිතර නිතර ප්‍රති ජීවක භාවිතය (Antibiotics) නිසා ශරීරයේ ප්‍රතිරෝදය හෙවත් ෂපපමබසඑහ තත්වය පහත බැසීමයි.

සෙම් ප්‍රතිෂ්‍යාව නොසලකා හැරීමත් ප්‍රතිෂ්‍යාව සඳහා නිසි ප්‍රතිකාර නොගැනීමත් සම්පූර්ණ සුවය ලැබෙන තෙක් නොඉඳ සීතල දිය නෑම, සීතලේ වැඩ වල යෙදීම, නිදි මැරීම හා සෘතු විපර්යාස මේ සඳහා මුල්වේ.

අත් බෙහෙත් වශයෙන් ඉඟුරු කොත්තමල්ලි පස්පංගුව තම්බා බීම, තම්බා දුම් ඇල්ලීම, මේ සඳහා ලපටි දෙහි කොලද යොදා ගන්න. බුද්ධ රාජ කල්කය ද සෙම සඳහා යෝග්‍යයවේ. කැස්සට වැල්මී හෝ කටුවැල් බටු සිරප් යෝග්‍යය වේ. නිවැරදි රෝග විනිශ්චයෙන් පසු ක්‍ෂාය බීමෙන්, පීනස් තෙල් හිස ගල්වා සහ කීප විටක් නස්‍ය කිරීමෙන් (Shiro Vasti, Shiro Dhara) සහ ගෙදරදී කරගත හැකි නස්‍ය තෙල් භාවිතය රෝගය සමනය කර ගත හැක.

**සෑම් දසනායක - ආයුර්වේද වෛද්‍යය**
පංච කර්ම විශේෂ - Kerala India
මාලේවන ශ්‍රී ඤාණිස්සර ආයුවේද වෛද්‍ය ශාස්ත්‍රී (ශ්‍රී ලංකා)
(BS Biology-USA) (GDip-Ayurvedic Panchakarma Therapy-India)


# ආයුර්වේද වෛද්‍ය හා ජ්‍යොතිෂ මධ්‍යස්ථානය

## සර්වාංග වෛද්‍ය ප්‍රතිකාර සහ සියලු පංචකර්ම ප්‍රතිකාර

- Rheumatoid Arthritis, Osteoporosis ආම වාත ඇතුළු සියළුම සන්දි ගත රෝග නිට්ටාවටම සුවකිරීම
- Psoriaisis, Eczema පොතු කබර, සුදු කබර ඇතුළු සියළුම චර්ම රෝග සඳහා
- Sinusitis, Rhino Sinusitis සෙම පීනස ඇතුළු සියළුම සෙම් රෝග සඳහා
- Cervical Spondylosis, Bulge Disk, Slip Disk ඇතුළු සියළුම කොඳුනාරටියේ දුර්වලතා
- Stress, Insomnia, Dementia ආතතිය ඇතුළු සියළුම මානසික දුර්වල සඳහා
- Irritable bowel syndrome උදර හා ආමාශගත සියලු රෝග
- Epilepsy මී මැසි මොරය
- Kidney stones and Nephritis මුත්‍රාශයේ ගල් සහ මුත්‍ර අමාරු සඳහා
- Balding and loosing hair අකලට හිස කෙස් පැහීම සහ තට්ටය පෑදීම
- Erectile dysfunction ලිංගික අප්‍රානික තාවය
- Hemiplegia and Paraplegia පක්‍ෂගාතය
- Gastritis and Hyper-acidity අම්ල පිත්තය සහ රක්තපිත
- Haemorrhoids අර්ශස්



## දියවැඩියාව
### හෙවත් මධුමේහය ප්‍රදාව
### DIABETES MELLITUS

**පුරාණ බෙහෙත් වට්ටෝරුවක දුර්ලබ ගනයේ ශාකසාරයෙන් හා හෙල වෙදකමේ ඇති අනෙකුත් ප්‍රත්‍යක්‍ෂ ආයුර්වේද බෙහෙත් වලින් දියවැඩියාව සඳහාම සාදන ලද ප්‍රත්‍යක්‍ෂ ආයුර්වේද බෙහෙත්.**

ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර සහ පරීක්‍ෂණ සඳහා
ආයුර්වේද වෛද්‍ය
**සෑම් දසනායක**
මාලේවන ශ්‍රී ඤාණිස්සර ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රී (ශ්‍රී ලංකා)
(BS Biology-USA) (GDip-Ayurvedic Panchakarma Therapy-India)

SAHANRO AYURVEDIC WELLNESS CENTRE
Arogya Parama laba
(Highest wealth is Health)

සියලුම විමසීම්
දුරකථන: 61 3 9886 6460
ජංගම: 0421 793 844
392 Blackburn Road,
East Burwood VIC 3151
BRANCH: DAHAM NIKETANAYA, YUROKE TEMPLE NORTH VICTORIA
1690 Mickleham Road, Yuroke, VIC 3063
E mail: sam@sahanro.com.au
www sahanro com au